00266

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**කළමනාකරණ අධ්‍යයන පීඨය**
**මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව**
**HRC2501 – මානව සම්පත් වෘත්තිකයන් සඳහා කළමනාකරණය**
**අවසාන පරීක්ෂණය: 2025**
**කාලය - පැය තුන (03)යි.**

---

**දිනය: 13.09.2025** **වේලාව: 01.30 PM- 04.30 PM**

---

**උපදෙස්:**

- I කොටස ලකුණු 40 ක් සඳහා ප්‍රශ්න 20 කින් සමන්විත වේ. I කොටසේ ඇති ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න සහ හිස්තැන් පුරවන්න. I කොටසට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- II කොටස ලකුණු 30 ක් සඳහා කුඩා සිද්ධි අධ්‍යයනයකින් (Case Study) සමන්විත වේ, එය අනිවාර්ය ප්‍රශ්නයකි. ලබා දී ඇති පිළිතුරු පොතෙහි (Answer Booklet) II කොටසෙහි ඇති සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- III කොටස ලකුණු 30 සඳහා රචනා ශෛලිය ප්‍රශ්න වලින් සමන්විත වේ. III කොටසේ ඇති ප්‍රශ්න 03 න් ඕනෑම ප්‍රශ්න 02කට පිළිතුරු සපයන්න. ලබා දී ඇති පිළිතුරු පොතෙහි III කොටසට පිළිතුරු සපයන්න.
- I කොටසේ සහ II කොටසේ සියළුම ප්‍රශ්න අනිවාර්ය වේ. I කොටසේ, II කොටසේ හා III කොටසේ පිළිතුරු පත්‍රයන් එකට අමුණා බාර දෙන්න.
- අපැහැදිලි අත් අකුරු ලකුණු අඩු වීමට හේතු වේ.

---

**විභාග අංකය:** .......................................................

**I කොටස**

**(සියළුම ප්‍රශ්න අනිවාර්ය වේ)**

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

1. පහත සඳහන් ඒවා අතරින් කළමනාකරණය සඳහා වඩාත් සුදුසු නිර්වචනය කුමක්ද?
   a. නිෂ්පාදන සහ සේවා නිපදවීමේ ක්‍රියාවලියයි
   b. ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට සම්පත් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, නායකත්වය ලබාදීම සහ පාලනය කිරීමේ ක්‍රියාවලියයි
   c. සේවකයන්ගේ පැමිණීම සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීමයි
   d. ආයතනයක් සඳහා මූල්‍ය ඉලක්ක පමණක් පිහිටුවීමයි
2. පහත සඳහන් ඒවා අතරින් නිවැරදි කළමනාකරණ කාර්යයන්හි අනුපිළිවෙල කුමක්ද?
   a. නායකත්වය ලබාදීම, සංවිධානය කිරීම, සැලසුම් කිරීම, පාලනය කිරීම
   b. පාලනය කිරීම, සැලසුම් කිරීම, නායකත්වය ලබාදීම, සංවිධානය කිරීම
   c. සැලසුම් කිරීම, සංවිධානය කිරීම, නායකත්වය ලබාදීම, පාලනය කිරීම
   d. සංවිධානය කිරීම, සැලසුම් කිරීම, පාලනය කිරීම, නායකත්වය ලබාදීම
3. විශේෂිත කාර්යයන් සිදුකිරීමේ දක්ෂතාවය හඳුන්වන්නේ
   a. තාක්ෂණික කුසලතා
   b. මානව කුසලතා
   c. සංකල්පීය කුසලතා
   d. පාලනය

4. පහත සඳහන් ඒවා අතරින් දෙපාර්තමේන්තුකරණය සඳහා භාවිත වන මූලික පදනමක් නොවන එක කුමක්ද?
   a. නිෂ්පාදන පදනම
   b. පාරිභෝගික පදනම
   c. සැපයුම්කරු පදනම
   d. භූගෝලීය පදනම

5. මින්ට්ස්බර්ග්ගේ (Mintsberg's) තොරතුරු භූමිකාවන්ට ඇතුළත් වන්නේ
   a) නාමික ප්‍රධානියා, නායකයා, සම්බන්ධීකාරක (Figurehead, Leader, Liaison)
   b) ව්‍යවසායකයා, බාධා හසුරුවන්නා, සම්පත් වෙන් කරන්නා (Entrepreneur, Disturbance handler, Resource allocator)
   c) නායකයා, බෙදාහරින්නා, නාමික ප්‍රධානියා (Leader, Disseminator, Figurehead)
   d) සුපරීක්ෂක, බෙදාහරින්නා, ප්‍රකාශකයා (Monitor, Disseminator, Spokesperson)

6. කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර වන්නේ
   a. ගැටලුව හඳුනා ගැනීම, විකල්ප ජනනය කිරීම, තීරණය ක්‍රියාත්මක කිරීම, විකල්ප ඇගයීම, තීරණය ඇගයීම
   b. ගැටලුව හඳුනා ගැනීම, තීරණය ක්‍රියාත්මක කිරීම, විකල්ප ඇගයීම, තීරණය ඇගයීම, විකල්ප ජනනය කිරීම
   c. ගැටලුව හඳුනා ගැනීම, තීරණය ක්‍රියාත්මක කිරීම, තීරණය ඇගයීම, විකල්ප ඇගයීම
   d. ගැටලුව හඳුනා ගැනීම, විකල්ප ජනනය කිරීම, විකල්ප ඇගයීම, තීරණය ක්‍රියාත්මක කිරීම, තීරණය ඇගයීම

7. සේවකයෙකු ඉටු කරන රාජකාරි ගණන මෙන්ම රැකියාව කෙරෙහි ඔහුගේ පාලන මට්ටම වැඩිවීම නිර්වචනය කරන්නේ
   a. රැකියා විස්තාරණය (Job enlargement)
   b. රැකියා පෝෂණය (Job enrichment)
   c. රැකියා භ්‍රමණය (Job rotation)
   d. මධ්‍යගතකරණය (Centralization)

8. සැලසුම් කිරීමේ වැදගත්කමක් නොවන්නේ පහත සඳහන් අතරින් කුමක්ද?
   a. අභිප්‍රේරණයේ සහ කැපවීමේ ප්‍රභවයක් සපයයි
   b. සම්පත් වෙන් කිරීමට මඟ පෙන්වයි
   c. සංවිධානයේ ක්‍රියාවන්ට මඟ පෙන්වයි
   d. අහඹු ලෙස කාර්යයන් බෙදා හරියි

9. Draft, R.L. (2022) ට අනුව, සංවිධානකරණය කිරීම යනු,
   a. සැලසුම් කිරීමේ කාර්යය සමඟ ඉදිරියට යන කළමනාකරණ කාර්යයයි
   b. උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීම සඳහා සංවිධානාත්මක සම්පත් යෙදවීම
   c. සංවිධානයේ උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීම සඳහා ආයතනික සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීමේ ක්‍රියාවලියයි
   d. අන් අයගේ හැසිරීම් නිවැරදි කිරීමට නැඹුරු වීමයි

10. ව්‍යාපාරික පරිසරය පිළිබඳ නිවැරදි ප්‍රකාශය යටින් ඉරි අඳින්න.

a. ශක්තීන් සහ තර්ජන අභ්‍යන්තර පරිසරයට අදාළ සාධක වේ
b. අවස්ථා සහ දුර්වලතා බාහිර පරිසරයට අදාළ සාධක වේ
c. ව්‍යාපාරික පරිසරය සංවිධානයක තීරණ ගැනීමට බලපාන්නේ නැත
d. ව්‍යාපාර කාර්යසාධනයට බලපාන අභ්‍යන්තර සහ බාහිර බලවේග දෙකම එයට ඇතුළත් වේ

11. ඉහළම මට්ටමේ කළමනාකරුවන්ට වඩාත් අවශ්‍ය වන්නේ .................................................................. (මානව කුසලතා/ සංකල්පනාත්මක කුසලතා/ තාක්ෂණික කුසලතා/ මෘදු කුසලතා) වේ.

12. විශේෂිත කාර්යභාරයන් වගකීම සහ බලතල සමඟ අනුයුක්ත කිරීම අර්ථ දක්වන්නේ ...................................................................................... (පැවරීම/දෙපාර්තමේන්තුකරණය/ කළමනාකරණ පරාසය/මධ්‍යගතකරණය) ලෙසය.

13. සංවිධානයේ අනෙකුත් සාමාජිකයන්ට තොරතුරු සම්ප්‍රේෂණය කිරීම ඇතුළත් කළමනාකරණ භූමිකාව .......................................................................................... (ප්‍රකාශක/බෙදාහරින්නා/නාමික ප්‍රධානියා/නායකයා) ලෙස හැඳින්වේ.

14. සේවකයන් කාලානුරූපව තනතුරකින් තවත් තනතුරකට මාරු කිරීම ................................................................... (රැකියා භ්‍රමණය/රැකියා විස්තාරණය/රැකියා පෝෂණය/වැඩ කණ්ඩායම) ලෙස හැඳින්වේ.

15. සංවිධානය කිරීමේ ක්‍රියාවලියේ දෙවැනි අදියර වන්නේ ............................................................... (දෙපාර්තමේන්තුකරණය/කාර්ය බෙදීම හඳුනා ගැනීම/කාර්යභාර පැවරීම/පැවරීම) වේ.

16. තීරණ ඉතා ඉක්මනින් හා ක්‍රියාවලියේ මැදදී පුද්ගලයෙකු විසින් ගන්නා නායකත්ව ශෛලිය ......................................................................................(ඒකාධිපති/ප්‍රජාතන්ත්‍රවාදී/නිර්බාධ නායකත්වය/නිලධාරිවාදී) නායකත්වයයි.

17. ....................................... (නායකයා/ කළමනාකරු/ සුපරීක්ෂක/ අධීක්ෂකයා) කාර්ය සාධනය පිළිබඳ අවධානය යොමු කරයි, සහ ............................................................ (සුපරීක්ෂක/ නායකයා/ කළමනාකරු/ අධීක්ෂකයා) මිනිසුන් පිළිබඳ අවධානය යොමු කරයි.

18. තීරණ ගැනීමේ බලය ඉහළ මට්ටමේ කළමනාකරුවන්ගේ අතර තබා ගැනීමේ ක්‍රියාවලිය ............................................... (බලපෑම/ මධ්‍යගතකරණය/ බලය/ විමධ්‍යගතකරණය) ලෙස හැඳින්වේ.

19. අනාගත නායකයින්ගේ සහ කළමනාකරුවන්ගේ සංවර්ධනය සඳහා සැලසුම් සකස් කරන කාර්යයක් ලෙස ......................................................................... (අනුප්‍රාප්තික සැලසුම්/ නායකත්වය/ පාලනය/ සංවිධානය කිරීම) හැඳින්වේ.

20. රැකියා විවෘත කිරීමක් සඳහා ආයතනයක් තුළ හෝ ඉන් පිටත සිටින වඩාත් සුදුසුකම් ලත් අයදුම්කරු හඳුනා ගැනීම, තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කිරීමේ ක්‍රියාවලිය ......................................................................................(මාණ්ඩලීකරණය/ආකර්ෂණය කිරීම/තෝරාගැනීම/ අනුස්ථාපනය කිරීම) ලෙස හැඳින්වේ.

**(ප්‍රශ්න 02*20 = ලකුණු 40)**

**- I කොටස නිමයි-**

**II කොටස**

**(සියළුම ප්‍රශ්න අනිවාර්ය වේ)**

L&T Builders Ltd යනු අලුතින් පිහිටුවන ලද මධ්‍යම ප්‍රමාණයේ ඉදිකිරීම් සමාගමකි. මෙම සමාගමේ ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුමට, පහසු මිලකට මහල් නිවාස සැලසුම් කිරීම, ඉදිකිරීම සහ විකිණීම ඇතුළත් වේ. එහි ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා තිබුණද, ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු කරනු ලැබේ, ඒ අතරට, ත්‍රිකුණාමලය, ගාල්ල, යාපනය, අනුරාධපුරය සහ හම්බන්තොටය ඇතුළත් වේ.

**මාලා** මෙම මධ්‍යම ප්‍රමාණයේ ඉදිකිරීම් සමාගමේ වත්මන් ප්‍රධාන විධායක නිලධාරිනිය වන අතර ඇය **පද්මා, ජැස්මින්, තරුෂි සහ ගාමිණී** යන අංශ කළමනාකරුවන් හතර දෙනාව අධීක්ෂණය කරයි. **පද්මා** ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා වන අතර, **ජැස්මින්** ප්‍රධාන මහජන නිලධාරියා වන අතර, **ගාමිණී** ප්‍රධාන ව්‍යාපාර සංවර්ධන නිලධාරියා වන අතර **තරුෂි** ප්‍රධාන මූල්‍ය නිලධාරියා වේ. මීට අමතරව, ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල පිහිටි ඉදිකිරීම් ස්ථානවල සේවය කරන තවත් ව්‍යාපෘති කළමනාකරුවන් පස් දෙනෙකු (05) සිටින අතර ඔවුන් සමස්ත කළමනාකරණය සඳහා වගකිව යුතුය. මෙම ව්‍යාපෘති කළමනාකරුවන් අදාල කාරණා සම්බන්ධයෙන් සියලුම අංශ කළමනාකරුවන්ට වාර්තා කරයි.

2018 මැයි මාසයේදී, නව අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවකින් අනාවරණය වන්නේ ගාල්ලේ ඉදිකිරීම් ස්ථානයේ වැඩකරුවන්ගේ මාසික වැටුප් ප්‍රමාදව ගෙවීම යන්නයි. 2018 අප්‍රේල් මස වැටුප් ලෙස සාමාන්‍ය වශයෙන් එක් පුද්ගලයෙකුට රු. 15,000 ක් ගෙවා ඇත. ඒ හේතුවෙන්, අභ්‍යන්තර විගණක විසින් **හරිනිව** (ගාල්ලේ ව්‍යාපෘති කළමනාකරු) විමර්ශනයකට කැඳවනු ලැබීය.

විමර්ශනයේදී **හරිනි** විස්තර කළේ, **ජැස්මින්** විසින් 2018 පෙබරවාරි මාසයේදී සියලුම ව්‍යාපෘති කළමනාකරුවන්ට විශේෂ උත්සව ප්‍රසාද දීමනා ලෙස අතිරේක රු. 5,000 ක් අප්‍රේල් මස ගෙවිය යුතු බවට ඊ-තැපෑලක් යැවූ බවයි. කෙසේ වෙතත්, **තරුෂි** අතිරේක ගෙවීම සඳහා අයවැය වෙන් කිරීම ප්‍රතික්ෂේප කළේය. මේ අනුව, **හරිනි** ව්‍යාකූල වූ අතර *තරුෂිගේ* අයවැය වෙන් කිරීම තෙක් බලා සිටීමට සිදු විය. තවද, මානව සම්පත් කළමනාකරණ අංශයේ අනුදැනුමකින් තොරව **හරිනි** වැටුප් ගෙවීම් ප්‍රමාද කර ඇත.

1. ගාල්ල ඉදිකිරීම් භූමිය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන වාර්තාවේ ඉස්මතු කර ඇති ප්‍රධාන ගැටළුව කුමක්ද? විස්තර කරන්න. **(ලකුණු 03)**

2. ඉහත සඳහන් ගැටලුවට හේතුව වූ කරුණ හඳුනාගෙන, සිද්ධි අධ්‍යයනය ඇසුරින් සාක්ෂි සහිතව විස්තර කරන්න. **(ලකුණු 05)**

3. ඉහත ප්‍රශ්නයේදී ඔබ ඉස්මතු කළ හේතුව නිසා නොසලකා හැර ඇති වැදගත් කළමනාකරණ මූලධර්මය පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

4.

a. ඉහත සිද්ධි අධ්‍යයනයේ විස්තර කර ඇති සංවිධානාත්මක ව්‍යුහයේ වර්ගය හඳුනාගෙන නිර්වචනය කරන්න. **(ලකුණු 07)**

b. ඉහත සිද්ධි අධ්‍යයනයේ විස්තරයට අදාල සංවිධානාත්මක ව්‍යුහය අඳින්න. **(ලකුණු 05)**

5. ඉහත ප්‍රධාන ගැටළුවට සංවිධාන ව්‍යුහය කෙසේ බලපා ඇත්දැයි පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

**(ලකුණු 30)**

**- II කොටස නිමයි-**

## III කොටස

**(ඕනෑම ප්‍රශ්න 02කට පිළිතුරු සපයන්න)**

### ප්‍රශ්නය 01

"කාර්යක්ෂමතාවයට සාපේක්ෂව ඕනෑම කළමනාකරුවෙකුට සඵලදායීතාවය වඩාත්ම වැදගත් වේ". උදාහරණයක් සමඟ විස්තර කරන්න.

**(ලකුණු 15)**

### ප්‍රශ්නය 02

"ලෝකය වෙනස් වන විට කළමනාකරුගේ භූමිකාව නිරන්තරයෙන් පරිණාමය වෙමින් පවතී". කළමනාකරුවෙකුගේ භූමිකාව හැඩගස්වන ප්‍රවණතා 05ක් හඳුනාගෙන පැහැදිලි කරන්න.

**(ලකුණු 15)**

### ප්‍රශ්නය 03

"කළමනාකරුවන් සහ නායකයින් යන දෙදෙනාම සංවිධානයක් තුළ දැකිය හැකිය." කළමනාකරුවන් සහ නායකයින් අතර සමානකම් සහ වෙනස්කම් දක්වමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

**(ලකුණු 15)**

**- III කොටස නිමයි-**

**- සියලු හිමිකම් ඇවරිණි -**